**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ එහි පරිපාලිතය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමටප්‍රමාණවත්“මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි76 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ දිනයෙන් පසුව මාස 12 ක් තුලදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා නොකරන වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කළයුතු වුවත් අධිකාරිය විසින් වසරකට වැඩි කාලයක් සඳහා ස්ථාවර තැන්පතු | 2021 අවසන් ගිණුම් සකස් කිරීම්දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වල ආයෝජනය කර තිබුණු රු. 58,010,000 ක් වූ ස්ථාවර තැන්පතු 15 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | | |
| (ආ) හුවමාරු නොවන ගනුදෙනුවක් යටතේ 1987 හා 1988 වර්ෂවල අත්පත් තරගෙන තිබූ හන්තාන නිවාඩු නිකේතනයට අයත් පර්චස් 170.56 ක ඉඩමේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට රු. 2,520 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 27 හා 47 ඡේදය ප්‍රකාරව සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. තවද, අධිකාරියේ ඉඩම්වල පිරිවැය රු.55,319,710 ක් ලෙස සඳහන් කර තිබුණද කාර්යාල හා කුලී ගොඩනැගිලි පිහිටි ඉඩම් කෙටස් 8286 ක් හා නිවාස යෝජනා ක්‍රම වලින් ඉතිරිවූ ඉඩම් හෙක්ටයාර් 473.15 ක් තක්සේරු කර සාධාරණ අගයමූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | හන්තාන නිවාඩු නිකේතනයට අයත් ඉඩමේ ප්‍රමාණය පර්.17.43 කි . හන්තාන නිවාඩු නිකේතනය පිහිටි ඉඩම් කොටස ද ඇතුළුවමෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් රු .752,337/= ක මුදලක් ගෙවා අංක 39 පිඹුරට අනුව අක්කර 148 රූඩ් 02 පර්චස් 03 විශාලැති ඉඩම මෙම අධිකාරියට පවරා ගෙන ඇත . ස්ථාවර වත්කම් තක්සේරු කිරිමට අදාලව හන්තාන නිවාඩු නිකේතනය පිහිටි ඉඩමේ තක්සේරුව ලබා ගැනීම 2020.02.06 වන දින තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත . නිවැරදි අගය තක්සේරුව ලද පසු පොත්වල සටහන් කිරිමට නියමිතය. | අධිකාරියට අයත් වත්කම් ඒවායේ තක්සේරු වටිනාකමට ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 1985 වර්ෂයේ සිට මිලදී ගෙන තිබුණු පිරිවැය රු. 269,362,610 ක් වූ මෝටර් රථ 135 ක් හා 2015 වර්ෂයට පෙර මිලට ගෙන තිබුණු පිරිවැය රු. 200,198,467 ක්වූ අනෙකුත් ස්ථාවර | මේ සඳහා කමිටුවක් පත්කර කාලපරිච්ඡේදය සංශෝධනය කර 2021 අවසන් ගිණුම් සඳහා සංශෝධනය කිරීමට නියමිතව ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වත්කම් සම්බන්ධව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වත්කම් රාශියක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද දැනටමත් භාවිතා කරමින් පැවතුණි. එසේ වුවත් මෙම වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර ප්‍රමිත අංක 03 ප්‍රකාරව මෙකී වත්කම් වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඈ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නිවාස හා කුලී/කල්බදු නිවාස ඒකක 43 ක තොගයේ වටිනාකම රු. 68,751,810 ක් ලෙස දක්වා තිබුණු අතර මෙයින් පිරිවැය රු. 6,263,121 ක් වූ නිවාස හා කඩසාප්පු 08 ක් කුලී පදනම මත බැහැර කර තිබුණි. එසේම තවත් නිවාස හා කඩසාප්පු 74 ක් සම්බන්ධව නීතිමය ගැටළු පැවතීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණු නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම කුලී/කල්බදු පදනම මත බැහැර කිරීමට ඇති නිවාස හා කඩසාප්පු 117 හි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 ප්‍රකාරව ආයෝජන වත්කම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි | 2021වර්ෂයේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1981 සිට 1995 දක්වා කාලය තුළ අධිකාරියට විදේශ ආධාර ලෙස ලැබී තිබුණු රු. 131,682,451 ක් වටිනා වත්කම් අධිකාරියේ වත්කම් යටතේ ගලපා ක්‍රමක්ෂය කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසානයට විදේශ අරමුදල් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, එහි ඇතුළත් රු. 96,707,280 ක් විදේශාධාර සම්බන්ධ තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 1981- 1995 දක්වා අධිකාරියට විදේශ ආධාර ලෙස ලැබු රු .131,682,451/- ගිණුම් ගැලපීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර 2021 වර්ෂයේ අවසන් ගිණුම් සකස්කිරීමේදී ගැළපීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු අතර විදේශාධාර සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) වීරකැටිය කලාප කාර්යාලයට ප්‍රධාන කාර්යාලයෙන් ප්‍රේෂණය කර තිබුණු රු.14,268,868 ක මුදලක් නිවැරදිව ගිණුම් ගතකර නොතිබීම හෝ ගිණුම්වලින් අත්හැරීම යන කරුණු මත ප්‍රධාන කාර්යාලයේ ඇති අනුරූපී මුදල් ශේෂය සමග නොගැලපීම නිසා ඉහත මුදල අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂයේ මුදල් ශේෂය ඉහත වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | පරීක්ෂා කරමින් පවතී. | මුදල් ශේෂය ප්‍රධාන කාර්යාලයේ වෙනත් ශේෂ සමග නොගැලපීමට හේතු ගැඹුරින් පරීක්ෂාකර වාර්තා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) අත්තිකාරම්, තැන්පතු, ලැබියයුතු ශේෂ | රු. 3,351,405 | විස්තරාත්මක උපලේඛන | උපලේඛන ඉදිරිපත් කර ඇත. | ප්‍රමාණවත් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) දිගුකාලීන පදනම මත, කොටස් වශයෙන් ගෙවීමට ලබාදුන් ඉඩම් හා නිවාස | රු21,823,692,283. | නිවාසලාභීන් හඳුනාගැනීමට හැකිවන පරිදි උපලේඛන ලියවිලි හා විස්තරාත්මක තොරතුරු | උපලේඛන ඉදිරිපත් කර ඇත. | ප්‍රමාණවත් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු ශේෂයක් ලෙස රු. 47,462,689 ක් 2010 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එම ශේෂය නැවත ප්‍රතිපූර්ණය නොකරන බව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේදී දන්වා තිබුණි. එසේ වුවත් එම ශේෂය පොත්වලින් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. එම නිසා අධිකාරියේ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන පොත්වලින් ලියා හැරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ අනුමැතිය ලබාගෙන කඩිනමින් පොත්වලින් ලියා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් බාහිර පාර්ශවයන් හා කාර්ය මණ්ඩලය වෙත ලබාදුන් අයවිය යුතු අත්තිකාරම් තැන්පතු ශේෂයන්හි එකතුව රු. 4,001,854,252 ක් විය. එයින් වසර 3-5 ත් අතර හා 05 ට වැඩි නිරවුල් කරගත යුතු | පරීක්ෂා කර ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ශේෂ පිළිවෙලින් රු. 963,293,386 ක් හා රු. 2,652,095,768 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන වනතෙක් එම ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මින් වසර 05 ට වැඩි කාලයක සිට ඉදිරියට ලැබිය යුතු ශේෂය සමස්ථ ණයගැති ශේෂයෙන් සියයට 33 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | | |
| (ඇ) ව්‍යාපෘති 30 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් මුදල් තුල වසර 05 ට වැඩි නිරවුල් නොකල අත්තිකාරම් වටිනාකම රු. 64,001,469 ක් විය. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | අතිතිකාරම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු සිදුකළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ණය හිමියන්ගෙන් අවුරුදු 10 ට වැඩි රු. 202,530,915 ක් හා අවුරුදු 05 ට වැඩි රු. 1,828,306 ,764 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර තවදුරටත් වගකීමක් නොමැති ණය ශේෂ පිළිබඳ සොයා බලා නැවත ආදායමට ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු කරමින් පවතී. | වගකීමක් නොමැති ණයහිමි ශේෂ පිළිබද සොයා බලා පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (බී) වගන්තිය | එකතුව රු.2,271,354,730 ක කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | දිගුකාලීන ආයෝජනයන් වන HDFC OVDC ආයෝජන නිසි අනුමතිය පරිදි සිදුකර ඇති අතර කෙටිකාලීන ආයෝජන අනුමතිය සඳහා අමාත්‍යංශය හරහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට ලිපියක් යොමුකර ඇත. | ආයෝජන සඳහා ලබාගත් අනුමැතිය තහවුරු කෙරෙන ලිපි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371 (5) හා 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 (ඇ) ඡේදය | (i) 1998 සහ 2019 වර්ෂයන්හිදී නිලධාරීන්ට ලබාදුන් පිළිවෙලින් රු. 200,000 ක් හා රු.42,272,005 ක්වූ අත්තිකාරම් 02 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. එසේම නිලධාරින්ට ලබාදුන් වසර 05 ඉක්මවූ එකතුව රු. 122,798 ක්වූ වැටුප් අත්තිකාරම් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් ලබා ගැනීමේදී හා පියවීමේදී කාර්යාල නියෝග අනුව කටයුතු කරන ලෙස දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. | අත්තිකාරම් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) විවධ ව්‍යාපෘති 73 ක් වෙනුවෙන් ලබාදුන් රු. 514,650,472 ක්වූ අත්තිකාරම් අවු.1 සිට අවු.5 ක කාලයක් ගතව තිබුණද | ඉංජිනේරු අංශය සමඟ ඒකාබද්ධව මෙම අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | අත්තිකාරම් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ii) මුදල් රෙගුලාසි 396 | දිස්ත්‍රික් කාර්යාල දෙකක බැංකු ගිණුම් 02 කට අදාල නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු. 602,142 ක් වූ මාස 06 ක් ඉක්මවූ චෙක්පත් 69 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බැංකු සැසඳුම් වල පැවති ගැටළු නිරාකරණය කර ඇත. | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාවිතයෙන් ඉවත් කළ වාහන හඳුනාගෙන අපහරණ ක්‍රියාවලිය සෑම වර්ෂයකම මාර්තු 31 දිනට නිමකළ යුතු වුවද 2017 වර්ෂයේ සිට අපහරණය කළ යුතුයැයි තීරණය කර තිබූ පිරිවැය රු. 16,143,675ක් වූ වාහන 11 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020/1 දරණ චක්‍රලේඛයට අනුව වාහන අපහරණ කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති PED/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | සෙවණ අරමුදලේ ප්‍රධාන අරමුණක් වන නිවාස අපේක්ෂිත ඉතා අසරණ දරුපවුල් වෙත සහන සැලසීම වෙනුවට අරමුදල් නැවත නැවත ආයෝජනය කරමින් පොලී ආදායමක් උපයා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී රු. 328,000,000ක මුදලක් ආයෝජනය කර තිබූ අතර මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | යෝග්‍ය පවුල් හඳුනාගෙන අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලිය දීර්ඝ කාලයක් ගතවීමත් කොවිඩ් 19 වසංගතය නිසා ප්‍රතිලාභ සැලසීමේ ප්‍රමාදයන් පැවතුණි. පවුල් 22 කට ප්‍රතිලාභ සැලසීමට කටයුතු කර ඇත. | අරමුදල අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට යොදාගත යුතුය. |
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන | ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදුකර නොමැති වාහන සඳහා ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් කරන ලෙස දැනුම් දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ඡේදය | අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවකට පසුව ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද අධිකාරියේ වාහන 36 ක් සම්බන්ධයෙන් මිලදී ගත් දින සිටම 2020 දෙසැම්බර් 31 දින දක්වා ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | | |
| (ඊ) 2003 මැයි 30 දිනැති අංක 12 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.4 ඡේදය | ආයතනයක සේවකයන් රේඛීය අමාත්‍යාංශයට හෝ වෙනත් ආයතනයක් වෙත කැබිනට් අනුමැතියකින් තොරව මුදාහැරිය නොහැකි බවත් එසේ විධිමත් අනුමැතියක් මත මුදාහරින්නේ නම් එම කාලය තුල කිසිඳු ගෙවීමක් සිදු නොකළ යුතු වුවත් ඊට පටහැනිව අධිකාරිය නිලධාරින් 12 ක් බාහිර ආයතන වෙත අනුමැතියක් නොමැතිව මුදාහැර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැටුප් සහිතව මුදාහැර තිබූ නිලධාරීන් තිදෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු. 7,782,481 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබුණි. වැටුප් නැවත ප්‍රතිපූරණය කිරීමේ පදනම මත වෙනත් අමාත්‍යාංශයකට මුදා හල නිලධාරියකු වෙනුවෙන් 2021 අප්‍රේල් 30 දිනට වසර 04 කට අධික කාලයක සිට ලැබිය යුතු රු. 164,657 ක් පැවතුණි. | නිවාස අධිකාරියට පැවරී ඇති නිවාස වැඩසටහන් වලට සමගාමී රාජකාරි සිදුකරන බැවින් නිලධාරීන් 07 කට වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය නොවේ. තිදෙනෙකු වැටුප් සහිතවද දෙදෙනකු වැටුප් රහිතවද බාහිර අයතන වෙත නිදහස් කර ඇත. | චක්‍රලේඛ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය සමූහයේ සහ අධිකාරියේ පිළිවෙලින් රු.මි.596 ක් සහ රු.මි.1,026 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය පිළිවෙලින් රු.මි.3,016 ක් හා රු.මි. 3,025 ක් විය. ඒ අනුව සමූහයේ හා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිළිවෙලින් රු.මි.2,420 රු.මි.1,998 ක පිරිහීම අඩුවීමක් නිරීක්ෂණය විය. අධිකාරියේ මෙම පිරිහීම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අයතන පරිපාලන වියදම් රු.මි.1,246 කින් අඩුවීම හා වෙනත් වියදම් රු.මි.1,594 කින් අඩුවීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

---

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 03 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලයෙහි අඛණ්ඩ ඌනතාවයක් පෙන්නුම් කර තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

---

සමාලෝචිත වර්ෂය අවසනායට අධිකාරියේ ජංගම අනුපාතය 2.19:1 ක් සහ ක්ෂණික අනුපාතය 1.79:1 වූ අතර පසුගිය වර්ෂවලදී පිළිවෙලින් 1.36:1 ක් හා 1.35:1 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 අනාර්ථික ගනුදෙනු

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරිය විසින් සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් පෞද්ගලික අංශය වෙත ගෙවිය යුතු වන්දි මුදල රු. 101,209,033ක් වූ අතර වන්දි ගෙවීම ප්‍රමාදවීම මත එම පාර්ශවයන් වෙත ගෙවිය යුතු පොලී මුදල රු. 33,852,455 ක් විය. අධිකාරිය විසින් මූලික වන්දි මුදල ගෙවීම ප්‍රමාදවීම නිසා ගෙවිය යුතු පොලිය මූලික වන්දි මුදල ඉක්මවූ අවස්ථා 24 ක් විය. | අත්පත් කරනු ලබන ඉඩම් බොහොමයක් අත්පත් කිරීමේ මුල් අවදියේදීම භුක්තිය භාර ගෙන නිවාස ඉදිකිරීම් අවසන් කර පුද්ගලයින් පදිංචි කරවා ඇතත්, පනතට අනුව හිමිකම් පරීක්ෂණ සිදු කර දන්වා එවීමට වර්ෂ ගණනාවක් යන බැවින් වාර්ෂිකව 7% බැගින් පොලියක්ද එකතු වී ඇත. එම හේතුවෙන් ඉඩම්වල වන්දි අභිබවා පොලී මුදලක් එකතු වී ඇත. | පවතින ගැටළු කඩිනමින් නිරවුල් කර වන්දි ගෙවීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය විසින් විකිණීම සඳහා ඉදිකිරීම් කටයුතු අවසන් කල පිරිවැය රු.6,263,123 ක් වූ නිවාස හා කඩසාප්පු 43 ක් විකිණීමට කටයුතු නොකර වසර 03 කට අධික කාලයක් වෙළෙඳ තොගයට ඇතුළත් කර තිබුණි. | මාසික බදු කුලිය තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන තක්සේරු වටිනාකම් ලැබුණු පසු නව මිල ගණන් යටතේ බැහැර කිරීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. |
| (ආ) මූල්‍ය අංශය, දේපල අංශය සහ දිස්ත්‍රික් කාර්යාල මගින් වෙන වෙනම දත්තයන් පවත්වා ගෙන ගියද විකිණීමට/කුලියට දීමට/බදු දීමට ඇති නිවාස හා කඩසාප්පුවල ඒකක ප්‍රමාණය හඳුනා ගැනීමට හැකිවන පරිදි සකස් කල මධ්‍යගත ලේඛනයක් අධිකාරිය විසින් නඩත්තු කර නොතිබුණි. | විකිණීමට/කුලියට දීමට බදු දීමට ඇති නිවාස හා සම්බන්ධ මධ්‍යගත ලේඛනයක් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු රැස්කිරීමට කටයුතු කරමින් පවතී. | අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා මධ්‍යගත ලේඛනයක් කඩිනමින් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) අධිකාරිය සතු මත්තේගොඩ නිවාස ක්‍රමයේ නිවසක 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා දිස්ත්‍රික් කළමනාකරුවකු පදිංචිවී සිටි අතර එය නියමිත ක්‍රමවේදයට කුලී/බදු දීම සිදුකර නොමැති අතර එම නිලධාරියාගෙන් කිසිඳු කුලී මුදලක් හෝ අයකිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | දැනට එම නිලධාරියාගේ වැඩ තහනම් කර ඇත. පදිංචි කාලයට අදාල මුදල ගණනය කර නිලධාරියාගෙන් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ආදර්ශ ගම්මාන ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශය (අත්වැල) ප්‍රකාරව ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ මූලික සුදුසුකම වූයේ ප්‍රතිලාභියාට හෝ කලත්‍රයාට නිවසක් නොතිබීම හා සැබෑ නිවාස අවශ්‍යතාවයක් තිබීම වේ. විගණනයට ඉදිරිපත් කල තොරතුරු වලට අනුව, වෙනත් නිවසක් හිමිවීම මත ප්‍රතිලාභීන් 182 ක් පදිංචි වී නොතිබුණු අතර තවත් ප්‍රතිලාභීන් 09 ක් තමන්ට හිමිවූ නිවාස විකුණා තිබුණි. මේ අනුව ප්‍රතිලාභියාගේ නිවාස අවශ්‍යතාවය පිළිබඳ නිවැරදි ඇගයීමක් සිදුකර නිවාස ලබාදී නොතිබුණු බව නිරීක්ෂණය විය. | ග්‍රාමනිලධාරි ගෙන් ලබා ගන්නා ලද නිවසක් හෝ ඉඩමක් නොමැති බවට වූ වාර්තා පදනම් කර ගනිමින් ප්‍රතිලාභීන් තෝරා ඇත. තවද ඉඩම් වෙන් කරන ආයතන විසින් ලබාදෙන නාමලේඛනද ඊට ඇතුළත් වේ. | විධිමත් ක්‍රමවේදයකට අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) ආදර්ශ ගම්මාන ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශය (අත්වැල) 2.1 වගන්තිය ප්‍රකාරව සුදුසු ඉඩම් තෝරා ගැනීමේ දුර්වලතාවයන් හේතුවෙන් දිස්ත්‍රික්ක 25 ක පිහිටුවා තිබුණු ආදර්ශ ගම්මාන වලට අදාලව නිවාස 1,089 ක නිවැසියන් පොදු පහසුකම් නොමැතිවීම හා වන සතුන්ගෙන් සිදුවන තර්ජන හේතුවෙන් නිවාස වල පදිංචි නොවීම නිසා එම නිවාස සඳහා වැයකර තිබුණු මුදල නිශ්කාර්ය වියදමක් බව | අදාළ ගම්මාන සඳහා විදුලිය, ජලය ලබාදී ඇත. මෙම ඉඩම් වන රක්ෂණ හෝ වනජීවී කලාපය තුළවූ ගම්මාන නොවේ. ගම්මානවල පදිංචි අය ගෙන් මාසික ණය වාරික අය කෙරේ. ආධාර නිවාස වල පදිංචි නොමැති අයගෙන් ආධාර මුදල් අයකර ගැනීමට කටයුතු කෙරේ. | ව්‍යාපෘතියකින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| විගණනයේදී නිරීක්ෂණය විය. මේ සඳහා වැය කළ මුදල පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.තවද 2019 වර්ෂයේ දිස්ත්‍රික්ක 12 ක විවෘත කල ආදර්ශ ගම්මාන 133 ක නිවැසියන් පදිංචි නොවීමේ ප්‍රතිශතය සියයට 15 සිට සියයට 42 දක්වා පරාසයක විය. | | |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල “ ඔබට ගෙයක් රටට හෙටක් ” වැඩසටහන යටතේ රු. 5,271,500,000 ක වියදමින් නිවාස ඒකක 10,000 ක වැඩ ආරම්භ කර නිවාස ඒකක 5,000 ක වැඩ නිම කිරීමට සැලසුම් කර තිබුණද වැඩ අවසන් කර තිබුණේ නිවාස ඒකක 3,949 ක පමණි. ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 90 ක ප්‍රතිපාදන ලැබී තිබුණද නිවාස ඒකක 6,051 ක් තවදුරටත් ඉදිකිරීමට පැවතුණි. | "රටට හෙටක් - ඔබට ගෙයක්" ආධාර වැඩසටහන යටතේ ඉදිකිරීමට සැලසුම් කළ නිවාස 10,000 හා වැඩ සම්පූර්ණ කිරීමට රු. ලක්ෂ 06 බැගින් රු.මිලියන 6,000 ක් අවශ්‍ය වේ. කෙසේ වෙතත් රු.මිලියන 5,271.5 ක් ඇස්තමේන්තු කළ අතර වර්ෂය අවසන් වන විට මෙම වැඩසටහන සඳහා භාණ්ඩාගාරය මගින් ලැබුණු මුදල රු.මිලියන 4,761.33 ක මුදලින් වැඩි කොටසක් එනම් රු.මිලියන 1,871 ක් ලැබුණේ 2020-12-31 දිනදීය. අරමුදල් ආයෝජනය හා භෞතික ප්‍රගතිය අතර කෙටිකාලීනව නොගැලපීමක් දක්නට හැකි වේ. මේ වන විට නිවාස 972 ක වැඩ නිමකර ඇත. | නිවාස ඉදිකිරීම් කටයුතු සැලසුම් කළ පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතු අතර අදාල සැළසුම් නිගමනය කර ප්‍රමාදවීම් වලට හේතු සොයා බලා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) අනෙකුත් අරමුදල් වැඩසටහන් යටතේ සමාලෝචිත වර්ෂයේ සෙවණ නිවාස ආධාර යටතේ නිවාස 300 ක් ඉදිකිරීමට සැලසුම් කලද පවුල් 22 ක් සඳහා පමණක් ප්‍රතිලාභ ලබාදී තිබුණි. ඉන්දියානු ආධාර යටතේ නිවාස 1,860 ක් ඉදිකිරීමට | පවුල් හඳුනාගත් පසු ගරු අමාත්‍යතුමාගේ, අමාත්‍යාංශ ලේකම්ගේ හා සෙවණ පාලක මණ්ඩලයේ ද අනුමැතිය ලබා ගැනීම දක්වා ඇති ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගතවීමත් රටේ පවතින COVID – වසංගත 19 තත්ත්වයත් හේතුවෙන් මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ සැලසීමේ ප්‍රමාදයක් පැවතිය ද මේ | ව්‍යාපෘති සැලසුම් කිරීමේදී පවතින තත්ත්වයන් සලකා බලා ක්‍රියාත්මක කල හැකි කාල රාමුවකට සැලසුම් සකස් කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| සැලසුම් කළද නිවාස 520 ක් පමණක් ඉදිකර තිබූ අතර මේ යටතේ සැලසුම් කරන ලද ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | වන විට පවුල් 22 කට ප්‍රතිලාභ සැලසීමට කටයුතු කර ඇත. | |
| (ඇ) 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ක්‍රියාත්මක කරන ලද විවිධ ආධාර සහ ණය වැඩසටහන් 13 ක නිවාස ඒකක 111,214 ක් අතුරින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිමකල නිවාස ඒකක ගණන 37,408 ක් හෙවත් සියයට 34 ක් විය. වැඩසටහන තුල ආරම්භ කරන ලද නිවාස ඒකක 3,656 ක වැඩ අතරමග නවතා දමා තිබුණි. | 2016-2019 කාල පරිච්ඡේදය තුළ විවිධ වැඩසටහන් යටතේ ආරම්භ කළ නිවාස නිම කිරීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වේ. 2020 වර්ෂය තුළ මෙම නිවාස වැඩසටහන සඳහා රාජ්‍ය අයවැය ප්‍රතිපාදන වෙන් නොවූ අතර එහෙයින් මෙම පරිච්ඡේද වැඩසටහන් වල සැලකිය යුතු ප්‍රගතියක් නොවීය. | අවිච්ඡේද ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සැමට සෙවණ නිවාස වැඩසටහන යටතේ 2016 වර්ෂයේ ආරම්භ කරන ලද 2018 අප්‍රේල් 11, 2018 දෙසැම්බර් 07, 2019 නොවැම්බර් 22 හා 2020 ජුනි 12 යන දිනයන්හි නිමකල යුතු ව්‍යාපෘති 05 ක නිවාස ඒකක 2,503 කින් නිවාස ඒකක 262 ක පමණක් 2020 දෙසැම්බර් 31 දින වන විට වැඩ නිමකර තිබූ අතර නිවාස ඒකක 1,815 ක් ඉදිකිරිමට කටයුතු කර නොතිබුණි. | 2020 වසරේදී නිවාස ඒකක 262 ක වැඩ නිමකර ඇතත් වර්ෂය තුළ මෙම නිවාස වැඩසටහන සඳහා රාජ්‍ය අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් නොවූ අතර ඒහෙයින් මෙම අවිච්ඡේද වැඩසටහන්වල සැලකිය යුතු ප්‍රගතියක් නොවීය. | අවසන් කිරීමට නොහැකිවූ ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීම කටයුතු කළ යුතුය. |
| (ඉ) ඉකුත් වර්ෂයේ රු 200,000,000 .ක වියදමකින් සැලසුම් කරන ලද නිවාස සංකීර්ණ ක් 33 අළුත්වැඩියා කිරීමේ සහ යටිතල පහසුකම් සංවර්ධනය පෘතියේ නිවාස කිරීමේ ව්‍යා ගතිය ශුන්‍යාක ප්‍ර 17 සංකීර්ණ .මට්ටමක පැවතුණි | 2019 වර්ෂයේ නගමු පුරවර ප්‍රතිපාදන යටතේ නිවාස සංකීර්ණ 33 ක් අළුත්වැඩියා කිරීමට නියමිතව පැවතියද ටෙන්ඩර් ඉදිරිපත් නොවීම හේතුවෙන් ව්‍යාපෘති 18 දක්වා අඩුවී ඇත. එසේම 2019 අවසාන වන විටත් සමහර ව්‍යාපෘතීන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවතීම හේතුවෙන් ආරම්භ වී නොතිබුණි. | අවසන් කිරීමට නොහැකි වූ ව්‍යාපෘති ඉදිරි වර්ෂවල ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනටඅනුමත සේවක සංඛ්‍යාව 2,164 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව ස්ථිර 1,175 ක්ද<br><br>පුද්ගලික වනසේ 446 ක්ද කොන්ත්‍රාත් පදනම මත 282 ක්ද දෛනික 75 ක්ද වශයෙන් එකතුව 1,978 ක් විය. එසේ වුවද එක් එක් තනතුරු විශ්ලේෂණයේදී පුරප්පාඩු 665 ක් හා අතිරික්තතා 295 ක් පැවතුණි. | අනුමත කාර්ය මණ්ඩලය පත්කිරීමේදී පුරප්පාඩු 665 ක් හා අතිරික්ත කාර්ය මණ්ඩලය 295 කි. | අනුමත කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගතකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ජුනි 03 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය පීකාරව අධිකාරිය 2018,2019 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2018 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකර ඇත. 2019 අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 04 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් යාවත්කාලීන කරන ලද සංවිධාන සැලැස්ම අනුමත සේවක සංඛ්‍යාව අයවැය ලේඛනය , වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, අග්‍රිම අවශ්‍යතා සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කළ යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. | ඒ ඒ අංශ විසින් අදාල සැළසුම් සකස් කර අවශ්‍ය අනුමැතිය ලිඛිතව ලබා ගන ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව සියළු කරුණු ඇතුළත් එක් සැලැස්මක් සකස් කළ යුතුය. |

**4.3 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන පරීක්ෂාවේදී ප්‍රධාන මෙහෙයුම් කටයුතු කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | කොවිඩ් වසංගතය සහ සේවක පුරප්පාඩු හේතුවෙන් ප්‍රමාණවත් විගණනයක් සිදු නොවීය. 2021 වර්ෂයේ ඒ සඳහා වැඩි අවධානයක් යොමු කෙරේ. | අභ්‍යන්තර විගණනය දිස්ත්‍රික් කාර්යාල සහ මෙහෙයුම් ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානය යොමු කළ යුතුය. |

**4.4** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයවැය හා තථ්‍ය ආදායම් වියදම් අතර සියයට 45 සිට සියයට 3,330 දක්වා විචලනයන් නිරීක්ෂණය විය. | ආදායම් හා වියදම් අතර සියයට 45 සිට සියයට 3,335 දක්වා විචලනයන් ඇතිව තොරතුරු ඉදිරිපත් කර ඇත. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. |